## 2018 අගෝස්තු මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්
## අපි ජීවමාන දෙවියන් වහන්සේගේ මන්දිර වෙමු

(2 කොරෙන්ති 6:16)

ස්වර්ගයේ වැඩ සිටින ශුද්ධවූ දෙවියන් වහන්සේ දේව ජනතාව සමඟ වැඩ සිටීමට නිතරම සූදානම්ව සිටින බව පුරාණ ගිවිසුමේ නික්මයාම පොත කියවද්දී පැහැදිලි වෙයි. එදා ඊශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා යන ගමනේදී දෙවියන් වහන්සේ දහවල් කාලයේදී වලාකුළක් ආකාරයෙන් ද, රාත්‍රී කාලයේදී ගිනිටැඹක් විලසින් ද , සිසිල් සුළඟක් ආකරයෙන් ද ඔවුන්ට සමීපව සිටිය බව සඳහන්ය. ආබ්‍රහම් සහ මෝසෙස් තුමන් ජනතාව වෙනුවෙන් මැදිහත් වී අයැදිද්දී එතුමන්ලාට කථා කළ බවත්, විවිධ දිවස්වරුන් මගින් ද සමිඳාණන් ප්‍රකාශ වී ඇත.

අද සුපුවතේ ශුද්ධවූ පාවුළු තුමා දෙවියන් වහන්සේව අදහන, ඔවුන් වහන්සේට ගරු බිය දක්වන ජනතාව දේව මාළිගවක් කරගෙන ඔවුන් සමග වැඩ සිටීමට නිතරම සූදානම්ව සිටින බව මතක් කරයි. එසේ නම් අපි කොතෙක් දුරට ඔවුන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධව ද, නොකැළැල්ව ද සිටිය යුතුද? එසේ සිටීමට නම් ජේසු ක්‍රිස්තු සමිඳානන්ගේ මැදිහත්වීමත්, ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහයත් අපට අතී අවශ්‍යයය. එයම අපගේ සිත කය කෙළෙසන සියළු දෙයින් වැලකී අපව පවිත්‍ර කර ගනිමින් දේවගරු බිය ඇතිව අපගේ ශුද්ධවන්තකම පරිපූර්ණ කරගත යුතු බව ශුද්ධවූ පාවුළු තුමා අවධාරණය කරයි.

අයැදීමේ සේවකයන් වශයෙන් මේ මාසය පුරාටම සමස්ථ පුබුදු ජනතාව ඇතුළු කිතුනු ජනතාවටම දේව ගරු බිය ඇතිව ජීවත් වෙමින් දේව කැමැත්තට හිස නමමින් ශුද්ධව නොකැළැල්ව ජීවත් වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා අයදිමු.

**"ප්‍රේමයෙන් ඔවුන් වහන්සේ ඉදිරියේ**
**අප ශුද්ධව ද, නොකැළැල්ව ද සිටින පිණිස**
**ලෝකය මැවීමට ප්‍රථමයෙන්**
**ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප තොරා ගත් සේක.**
**තවද, ස්වකීය ප්‍රසාදය හා අරමුණ අනුව,**
**ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණ කොට ගෙන**
**ඔවුන් වහන්සේ අප දරුකමට පිළිගන්නා පිණිස**
**දෙවියන් වහන්සේ පෙර නියම කළ සේක."** (එපීස 1:4-6)

පළමු සතිය - දිව්‍යමය කියවීම : 2කොරෙන්ති 6:16 - 7:1

අයැදීමට විශේෂ යොමුව :

සමස්ථ පුබුදු සහ කිතුනු ජනතාවට දේව ගරු බිය ඇතිව ජීවත් වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා අයදිමු. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව, සුසමථ එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්
* අගෝස්තු මස 11-15 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන භාග්‍යවන්ත මාතාව සහ සක්‍රමේන්තු පිළිබඳ ශ්‍රද්ධානකාන්තියට සහභාගි වන ජනතාව සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* මත්පැන්, මත් ද්‍රව්‍ය ඇතුළු වගාවට අහිතකර පලිබෝධනාශක සහ කෘතිම රසකාරක භාවිතයෙන් අප රට ජනතාව ආරක්ෂා කරන පිණිසත්, එවැනි දෑ බෙදා හරින ජාවාරම් කරුවන් සහ බහුජාතික සමාගම්වල බල බිඳෙන පිණිස නපුරායට අණ කරමින් යාච්ඤා කරන්න.
* වෙනත් අයැදීම් .....

දෙවන සතිය - දිව්‍යමය කියවීම : 1කොරෙන්ති 3:16-23

අයැදීමට විශේෂ යොමුව :

අධික ණය බරින්, රෝගී තත්ත්වයන්ගෙන් සහ පෝෂ්‍යදායක ආහාර නොමැතිව දුක් විඳින ජනතාව සහ පාසල් නොයන දරුවන් වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* අගෝස්තු 17-18-19 දිනවල හලාවත පදවිය තුළ පුබුදු වගකීමක් ගන්නා අය සඳහා පාලකුඩා ශ්‍රී රම්‍යාරාමයේ පැවැත්වෙන ඥානකාන්තිය සහ වචනයේ සේවකයා වෙනුවෙන්.
* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* විදේශ රටවල පුබුදු සංඝයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

තෙවන සතිය - දිව්‍යමය කියවීම : රෝම 8:18-27

අයැදීමට විශේෂ යොමුවක් :
අයැදීම් සහයක එකතුව සහ අයැදීම් එකතුවලට සම්බන්ධ සියළු දෙනා වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* අගෝස්තු 21-22 දිනයන්හි ප්‍රශංසරාමයේ පැවැත්වෙන සුමැදි මව්වරුන්ගේ ඥානකාන්තිය සහ වචනයේ සේවකයන් වෙනුවෙන්
* පුබුදු තරුණ / තරුණි / ශිෂ්‍ය /ශිෂ්‍යා/ ළමා අංශයන් වෙනුවෙන්.
* ප්‍රබෝධයේ වැඩපිළිවෙල සහ වගකීම් ගන්නා අය වෙනුවෙන්
* වෙනත් අයැදීම් .....

සතරවන සතිය - දිව්‍යමය කියවීම: ශු.මතෙව් 7:21-23

අයැදීමට විශේෂ යොමුවක් :
දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :
* ජුසේවාස් මෙහෙයුමට සම්බන්ධව අනගාරික දූත සේවාවේ යෙදෙන සියළු දෙනා වෙනුවෙන්
* භේදභින්න වී සිටින පවුල් වෙනුවෙන්
* අනාත නිවාසවල සහ වැඩිහටි නිවාසවල සිටින දරුවන් සහ වැඩිහිටියන් වෙනුවෙන්
* සුබැදි සංඝය වෙනුවෙන්
* වෙනත් අයැදීම් ....

දැන්වීම් :
* සිකුරාදා දිනවල යාච්ඤාවේ සහ භාවනාවේ දිනයක් ලෙස ගත කරන්න.

**"දෙවියන් වහන්සේගේ වචනය ජීවමානය, ක්‍රියාශීලිය,**
**දෙමුහත් කඩුවකටවත් වඩා තියුණුය.**
**ආත්මය ප්‍රාණ වායුවෙන්ද සන්ධි ඇට මිදුළු වලින්ද**
**වෙන් කරන තරම් විනිවිද යන්නේ ය.**
**ඔවුන් වහන්සේ කෙරෙන් සැඟවිය නොහැකි කිසිවක් මුළු විශ්වයේම නැත.**
**ඔවුන් වහන්සේ ඉදිරියෙහි සියල්ල වැස්මක් නැතිව විවෘතව තිබේ.**
**අප ගණන් දිය යුත්තේ ඔවුන් වහන්සේට ය."** (හෙබ්‍රෙව් 4:12-13)

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************